# විසර්ජන ශීර්ෂය 179 - ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව -2012 වර්ෂය

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

## 1 කොටස

## ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

### 1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 281 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 284 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව |

### 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

#### (අ). මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 02 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.42,032,334,200 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.41,389,728,747 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.59,831,316 ක සිට රු.315,585,601 දක්වා වූ පරාසයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.16 සිට සියයට 25.8 ක් දක්වා පරාසයක පැවැතිණ. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 179 | ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | 36,576,704,200 | 146,030,000 | 36,575,583,279 | 87,319,605 | 1,120,921 | 58,710,395 |
| 281 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 3,260,080,000 | 829,100,000 | 3,259,933,493 | 562,057,971 | 146,507 | 267,042,029 |
| 284 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 483,070,000 | 737,350,000 | 480,680,671 | 424,153,728 | 2,389,329 | 313,196,272 |
| | **එකතුව** | 40,319,854,200 | 1,712,480,000 | 40,316,197,443 | 1,073,531,304 | 3,656,757 | 638,948,696 |

**(ආ). වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සදහා වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් පහත සදහන් පරිදි එකතුව රු.337,636,310 ක් වූ ප්‍රතිපාදන ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයට හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු අතර ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රතිපාදන ලබාගත් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදන ලබාදුන් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ලැබුණු ප්‍රතිපාදනය | උපයෝජනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු |
| **ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය** | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 138,000,000 | 120,315,444 | 17,684,556 |
| එම | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 1,226,626 | 1,226,626 | - |
| එම | කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 473,162 | 473,162 | - |
| එම | ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 540,000 | 335,479 | 204,521 |
| එම | කෘෂිකර්ම අමාත්‍යාංශය | 213,540 | 197,146 | 16,394 |
| **ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව** | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 178,299,972 | 70,497,275 | 107,802,697 |
| එම | කෘෂිකර්ම අමාත්‍යාංශය | 18,883,010 | 16,055,115 | 2,827,895 |
| | එකතුව | 337,636,310 | 209,100,247 | 128,536,063 |

## 2.2 ආදායම් ගිණුම්

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

දෙපාර්තමේන්තුවක් විසින් 2012 වර්ෂයේදී ආදායම් සංකේත 01 ක් සඳහා රු.මිලියන 17 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර තථ්‍ය අදායම් ලෙස රු.මිලියන 17.27 ක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 101.6 ක ආදායමක් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් ගණන් දීමේ නිලධාරී | ආදායම් සංකේතය | ඇස්තමේන්තුගත | තථ්‍ය | වැඩියෙන් එකතු කිරීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | % |
| වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් | 20.03.02.06 | 17,000,000 | 17,268,785 | 268,785 | 101.6 |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

#### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක් වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 179 | 17901 | 3,500,000 | 3,465,427 | 3,000,000 | 4,475,012 | 30,000,000 | 16,291,392 |
| 281 | 28101 | 232,500,000 | 118,663,861 | 140,000,000 | 177,023,373 | 830,000,000 | 384,727,859 |
| 284 | 28401 | 40,000,000 | 36,746,640 | 27,000,000 | 33,101,943 | 127,000,000 | 117,544,304 |

## 2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### (අ). අග්‍රිම ගිණුම්

2012 දෙසැම්බර් 31 දින වන විට ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයේ අග්‍රිම ගිණුමේ රු.29,000 ක හර ශේෂයක් පැවැතුණි.

**(ආ). පොදු තැන්පත් ගිණුම්**

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක පොදු තැන්පත් ගිණුම්වල එකතුව රු.1,626,096,710 ක් වූ ශේෂ පැවතුණු අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **ගිණුම් අංකය** | **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|---|
| | | රු. |
| ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | 6000/0000/00/0015/0188/000 | 345,824 |
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0001/0010/000 | 15,700 |
| | 6000/0000/00/0002/0010/000 | 247,600 |
| | 6000/0000/00/0006/0051/000 | 262,330,182 |
| | 6000/0000/00/0015/0136/000 | 147,243,707 |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0139/000 | 102,096,520 |
| | 6000/0000/00/0006/0020/000 | 1,113,817,177 |
| එකතුව | | 1,626,096,710 |

## 2 කොටස

### එක් එක් විසර්ජන ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

### විසර්ජන ශීර්ෂය 179 - ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය

**1.1 විගණන විෂය පථය**

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජූලි 30 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවතවා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණ**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

1989 මාර්තු 23 දිනැති අංක 19/89 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර අතිකාල ලේඛනයක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පවත්වා නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

(i) පුනරාවර්තන වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.25,000 ක හා මූලධන වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු රු.4,675,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) මූලධන වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා ගැනීම හේතුවෙන් එම වැය විෂයන්හි එකතුව රු.50,339,315 ක් හෙවත් අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 40 සියයට 98 ත් අතර පරාසයක ප්‍රමාණයක් ඉතිරිවී තිබුණි.

**(ඇ) රාජ්‍ය වියදම් කළමනාකරණය**

2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2012 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවලින් සළසා තිබුණු පුනරාවර්තන ප්‍රතිපාදනවලින් සියයට 2 ක් ප්‍රමාණයක ප්‍රතිපාදන අමාත්‍යාංශය විසින් අවුරා තබා නොතිබුණි.

**(ඈ) අග්‍රිම ගිණුම්**

2012 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමක 2011 වර්ෂයේ සිට පැවත එන රු.29,000 ක හර ශේෂයක් වූ අතර, ශේෂය 2013 අප්‍රේල් 30 දින වන විටද පියවා නොතිබුණි.

**(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

විෂය අංක 17901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවිම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.235,468 ක් විය.

**1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**1.4.1 සංයුක්ත සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2011-2015 කාලපරිච්ඡේදය සඳහා අමාත්‍යාංශය විසින් සංයුක්ත සැලැස්ම 2012 මැයි 23 දින පිළියෙල කර තිබුණද එම සැලැස්මද අමාත්‍යාංශ කාර්යභාරය ආවරණය වන පරිදි පිළියෙල කර නොතිබුණි. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල කාර්යයන් පමණක් ඇතුළත් කර තිබූ බැවින් එය අසම්පූර්ණ සැලැස්මක් වී තිබුණි. 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5/(4) දරන රාජ්‍ය මුදල්

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව ඒ ඒ වර්ෂ ආරම්භයේදී යථාවත් කරන ලද සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 1.4.2 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ පොහොර සහනාධාර වැඩසටහන සඳහා රු.2,656,439,200 ක ප්‍රතිපාදන සලසා වියදම් දරා තිබුණද එම කාර්ය ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී කාබනික පොහොර නිෂ්පාදනය හා බෙදාහැරීමේ වැඩසටහන සඳහා රු.74,168,780 ක් උපයෝජනය කර තිබුණද එම වැඩසටහනද ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

### 1.5 වත්කම් කළමනාකරණය

**වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වෙනත් ආයතන 02 ක් සත වාහන 02 ක් චක්‍රලේඛ විධිවිධාන අනුව විධිමත් පවරා ගැනීමකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතා කර තිබුණි.

### 1.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය පරීක්ෂාවේදි පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) අනුරාධපුරය හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකෙහි කාබනික පොහොර නිපදවීම දිරිමත් කිරීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභී ගොවීන් නිපදවන පොහොර කි.ග්‍රෑ.1 කට රු.8.00 බැගින් ගෙවා තිබුණි. අනුරාධපුරය දිස්ත්‍රිකකයේ පොහොර කි.ග්‍රෑ.2,404,950 ක් නිපදවීම සඳහා රු.19,239,600 ක් ගෙවා තිබුණද, පරීක්ෂා කළ නියැඳියේ නිපදවූ පොහොර ප්‍රමාණය සනාථ කර ගැනීමට සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. තුලාන දෙකකට පොහොර කි.ග්‍රෑ.74,359 නිපදවීම වෙනුවෙන් රු.594,872 ක් ගෙවා තිබුණද නිෂ්පාදනය කර තිබුණේ රු.55,072 ක් වටිනා පොහොර කි.ග්‍රෑ.6,884 ක් පමණක් වී තිබුණි.

(ආ) කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන සඳහා උනන්දුවක් දක්වන සුදුසුම පුද්ගලයන් තෝරා ගෙන උපකරණ කට්ටල හා ද්‍රව්‍ය ලබාදී නොතිබුණු බැවින් අක්‍රීය ඒකක වැඩි සංඛ්‍යාවක් නිරීක්ෂණය විය.

(ඇ) 2012 පෙබරවාරි 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි වැඩසටහනේ ප්‍රගතිය අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කර නොතිබුණි. එසේම මාසයක් ඇතුළත කාබනික පොහොර නිෂ්පාදකයන් දිරිගැන්වීමේ වැඩපිළිවෙලක් සකස් කර එය සලකා බැලීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණද, එම කාර්යය ඉටුකර නොතිබුණි.

**1.7** **අවිධිමත් ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව රජය විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති සඳහා තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතු වුවද, ඉන් බැහැරව 2012 මැයි මාසයේදී හදිසි අවශ්‍යතාවයක් ලෙස සළකා තහඩු මඩු ආවරණ 750 ක් මිලදී ගැනීමට සීමිත මිලගණන් කැඳවා තිබුණ. 2013 ජනවාරි 12 දින වන විටත් අවස්ථා 03 කදී ඉන් තහඩු මඩු ආවරණ 135 ක් පමණක් සපයා තිබුණි. මෙම මිලදී ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදෙශ සංග්‍රහය ප්‍රකාරව සැපයුම්කරු සමඟ විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) වී හැර අනෙකුත් භෝග සඳහා පොහොර ආනයනය කිරීමේදී පෞද්ගලික පොහොර ආනයනකරුවන්ට දැරීමට සිදුවූ පිරිවැයට වඩා වැඩි මිලක් පොහොර මිල තීරණය කිරීමේ කමිටුව විසින් තීරණය කර ගෙවීම් කිරීම නිසා එම සමාගම්වලට සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 330 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

**1.8** **පාඩු හා හානි**

2011 අප්‍රේල් 11 දින වාහනයක් අනතුරට පත්වී රු.147,312 ක අලාභයක් සිදුවී තිබුණි. ඒ පිළිබඳ මූලික පරීක්ෂණයේදී අදාල අලාභයට වගකිව යුතු මාධ්‍ය ලේකම්වරයාගෙන් එම අලාභය අයකර ගැනීමට තීරණය කර තිබුණත් 2013 අගෝස්තු 31 වන විටත් එම අලාභය අයකර ගෙන නොතිබුණි.

**1.9** **කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික්ක දෙකක කාබනික පොහොර නිෂ්පාදනය කරන ගොවීන්ට බෙදාදීම සඳහා රු.68,328,235 ක් වැයකර අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය මිලදීගෙන තිබුණද, ඒ පිළිබඳ නියැඳි පරීක්ෂාවේදී ගොවිජන සේවා මධ්‍යස්ථාන 06 ක උපකරණ කට්ටල 3,465 කින් කට්ටල 581 ක් ද, තණකොළ කපන යන්ත්‍ර 82 කින් යන්ත්‍ර 05 ක්ද, තහඩු මඩු 22 කින් මඩු 11 ක්ද, පොලිතින් කි.ග්‍රෑ.1,638 කින් කි.ග්‍රෑ.973 ක්ද 2013 ජූලි මාසය අවසාන වන විටත් ගොවීන්ට බෙදාදී නොතිබුණි.

(ආ) ගොවිජන සේවා මධ්‍යස්ථාන 40 කට උපකරණ ලබාදී තිබුණද ඉන් ගොවිජන සේවා මධ්‍යස්ථාන 19 කට අදාල ගොවීන් පොහොර නිපදවා නොතිබුණි.

## 1.10 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 19 | 16 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (iii) | ද්විතියක මට්ටම | 110 | 79 | 31 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 35 | 35 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 03 | 03 | - |
| | එකතුව | 170 | 135 | 35 |

පුරප්පාඩු 35 ක් පිරවීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත් වී තිබුණි.

### (ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයනගෙන් ලබාගත් මානව සම්පත්

අමාත්‍යාංශය විසින් අවිධිමත් ලෙස වෙනත් ආයතනවලින් ලබා ගෙන තිබූ සේවක සංඛ්‍යාව 06 ක් වූ අතර විස්තර පහත දැක්වේ.

| | සේවක වර්ගය | සේවක සංඛ්‍යාව | මානව සම්පත් ලබාගත් පාර්ශව | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| (i) | ද්විතියක මට්ටම | 02 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 2010.11.26 සිට 2013.08.31 දක්වා |
| (ii) | ද්විතියක මට්ටම | 01 | කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 2010.11.26 ට 2013.08.31 දක්වා |
| (iii) | ද්විතියක මට්ටම | 02 | ලංකා පොහොර සමාගම | 2010.11.26 ට 2012.12.31 දක්වා |
| (iv) | ප්‍රාථමික මට්ටම | 01 | ජනතා පොහොර ව්‍යාවසාය | 2011.12.20 සිට 2013.08.31දක්වා |

## 2. විසර්ජන ශිර්ෂය 281- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව **2013 සැප්තැම්බර් 06** දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනව දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනිම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) ගිණුම් ඉදිරිපත් කිරිම

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් විෂය අංක 28101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය මාස 1 කට වැඩි ප්‍රමාදයකින් පසුව 2013 මැයි 07 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. ගොවිජන සංවර්ධන කමිටුවල මූල්‍ය ප්‍රකාශන 2006 වර්ෂයේ සිට පහත පරිදි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | ගිණුම් වර්ෂය | ඉදිරිපත් නොකළ ගිණුම් ප්‍රමාණය |
|---|---|---|
| ගොවිජන සංවර්ධන කමිටුවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන | 2006 | 87 |
| | 2007 | 112 |
| | 2008 | 87 |
| | 2009 | 78 |
| | 2010 | 95 |
| | 2011 | 126 |
| | **2012** | 284 |

(ආ) **රාජ්‍ය වියදම් කළමනාකරණය**

2012 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් සළසා තිබුණු ප්‍රතිපාදනවලින් 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පුනරාවර්තන ප්‍රතිපාදනවලින් සියයට 2 ක ප්‍රමාණයක් අවුරා තබා නොතිබුණි.

(ඇ) **පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අංක 6000/0000/00/0006/0051/000 දරන තැන්පත් ගිණුමේ දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර රු.651,797 ක වෙනසක් වර්ෂ 3 කට වඩා වැඩි කාලයක සිට පැවැති අතර, එම වෙනස සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයේදී අංක 6000/0000/00/0015/0136/000 දරන තැන්පත් ගිණුමේ දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර රු.49,811,908 ක වෙනසක් නිරක්ෂණය වු අතර මුදල් රෙගුලාසි 427 ප්‍රකාරව සසඳා නොතිබුණි.

**(ඈ)** රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

(i) විෂය අංක **28101** දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ **2012** දෙසැම්බර් **31** දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවිම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.**26,330,303** ක්වූ අතර, *එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම්* කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි. එම හිඟ හිටි ශේෂය තුළ වූ පහත සඳහන් එකතුව රු. 931,411 ක කල්පසුවූ ණය ශේෂ නිරීක්ෂණය වූ අතර එම ණය ශේෂ අයකර ගැනීමට සක්‍රීය වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

| | ණය වර්ගය | ණය ශේෂය |
|---|---|---|
| | | රු. |
| (අ) | 2006 වර්ෂයේදී වැටුප් රහිත නිවාඩු මත විදේශගතව ඇති නිලධාරීන් | 102,980 |
| (ආ) | 2006 වර්ෂයේදී පළාත් සභාවලට හා ප්‍රාදේශීය සභාවලට තරඟකොට තේරී පත් වූ මන්ත්‍රීන් | 55,110 |
| (ඇ) | පළාත් සභා නිලධාරීන් ලෙස අන්තර්ග්‍රහණය කළ ගොවිජන සේවා නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් ලෙස අන්තර්ග්‍රහණය කළ වගා නිලධාරීන් | 773,321 |
| | එකතුව | 931,411 |

එමෙන්ම දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කළ වයඹ පළාත් සභා නිලධාරීන්ගෙන් රු. 593,000 ක ණය ශේෂයක් වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවත එන අතර, එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) කේවල ශේෂ වර්ගීකරණයේ එකතුව හා පාලන ගිණුමේ ශේෂය අතර රු.**2,674,352** ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස සසඳා ගිණුම් නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තා

2002 සැප්තැම්බර් 12 දිනැති හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 හා 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව මුදල වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව **2013** අගෝස්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**2.5** වත්කම් කළමනාකරණය

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් දෙපාර්තමේන්තුවේ පැවතුණි.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| නිල නිවාස | 100 | වර්ෂ 1 කට වැඩි |
| යන්ත්‍ර | 12 | වර්ෂ 1 - 3 |
| වාහන | 21 | වර්ෂ 1 - 5 |

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික්ක 06 කට ලබාදී තිබූ එකතුව රු.29,637,925 ක් වටිනා කාර්යාල උපකරණ විගණනයට ඉදිරිපත් කළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවල ඇතුළත් කර නොතිබුණි.

**2.6** අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛය<br>**2009 නොවැම්බර් 13 දිනැති**<br>අංක **438** දරන චක්‍රලේඛය | | (i) අපහරණය කළයුතු වාහන 09 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.<br>(ii) ගොවිජන සේවා මධ්‍යස්ථාන 143 කට බෙදා දී තිබූ කෘෂි උපකරණ 443 ක් සමීක්ෂණ මණ්ඩලය විසින් අපහරණය කිරීමට තීරණය කර තිබුණත් එසේ කර නොතිබුණි. |
| (ආ) | භාණ්ඩාගාර චක්‍රලේඛ<br>**1978 දෙසැම්බර් 19 දිනැති**<br>අංක **842** දරන චක්‍රලේඛය | | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | <u>දෙපාර්තමේන්තු චක්‍රලේඛය</u> **2012** සැප්තැම්බර් **29** දිනැති අංක **014/2012** දරන චක්‍රලේඛයේ **4.3** වගන්තිය | 393,262 | ගොවිජන බැංකුවක අත ඉතිරි මුදල් වශයෙන් තබාගත හැකි උපරිම මුදල් ප්‍රමාණය රු.10,000 ක් ලෙස දක්වා තිබුණ ද එම සීමාව ඉක්මවා බැංකු 08 ක එකතුව රු.393,262 ක් වූ අත ඉතිරි මුදලක් තබා ගෙන තිබුණි. |

**2.7** ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| | රු. | | |
| එල්ලංගා වැව් අළුත්වැඩියා කිරිමේ ව්‍යාපෘතිය - ගිරිදේවි වැව තණමල්විල | 6,966,242 | 2012 ජනවාරි | වැවේ අයිතිය නිරවුල් කිරිමේ ප්‍රමාදය |

(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් විය.

| ව්‍යාපෘතිය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | ඇස්තමේන්තු ගත පිරිවැය | **2012** දෙසැම්බර් **31** දින වන විට වියදම |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| තලල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානය ඉදිකිරිම | | | | |
| අදියර I | 2010.12.29 | 2011.06.29 | 4,163,261 | 2,712,417 |
| අදියර II | 2011.12.12 | 2012.03.26 | 4,125,430 | 1,635,099 |
| පරංගියාවාඩිය ගොවිජන සේවා මධ්‍යස්ථානය අළුත්වැඩියාව | 2012.01.28 | 2012.01.08 | 1,984,336 | 706,834 |

## 2.8 කාර්යසාධනය

2012 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්වලට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

(අ) ක්‍රියාකාරී සැලැස්මට අනුව 2KR ව්‍යාපෘතිය යටතේ ලබාදුන් ට්‍රැක්ටර් හා වතුර පොම්ප සඳහා හිඟ ණය වාරික පිළිවෙලින් රු.552,689,784 ක් හා රු.5,692,602 ක් ද අයකර ගැනීමට අපොහොසත්ව තිබූ අතර, භාවිතයෙන් ඉවත් කර තිබූ ට්‍රැක්ටර්, අපහරණය කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව දිස්ත්‍රික්ක 11 ක වැව් 86 ක් ගැඹුරු කිරීම සඳහා ඉලක්ක කර තිබුණද දිස්ත්‍රික්ක 10 ක වැව් 18 ක පමණක් ගැඹුරු කර තිබුණි.

(ඇ) 2012 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව පොහොර ගබඩා 10 ක් ඉදිකිරිම සඳහා ඉලක්ක කර රු.මිලියන 20 ක ප්‍රතිපාදන සළසා තිබුණද, ඉන් රු.මිලියන 2.6 ක් වැයකර 2012 දෙසැම්බර් 31 දින වනවිට පොහොර ගබඩා 3 ක් පමණක් ඉදිකර තිබුණි.

## 2.9 අනාර්ථික ගනුදෙනු

බුල්ඩෝසර් යන්ත්‍ර 03 ක් අළුත්වැඩියා කිරීම සඳහා රු.1,639,180 ක් වැයකර තිබුණත් එම යන්ත්‍ර සේවයේ යොදවා නොතිබුණ අතර, තවත් යන්ත්‍ර 03 ක් සඳහා අළුත්වැඩියා වියදම් ලෙස රු.2,176,231 ක් වැය කර යන්ත්‍ර පැය 252 ක් පමණක් සේවයේ යොදවා තිබුණි.

## 2.10 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### විසදා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පරීක්ෂා කිරීමෙන් පසු ඒ පිළිබඳ පසුවිපරම් කටයුතු නිම නොකළ ඡේද පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂය | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්විමේ දිනය | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | | | |
| 2005 | 06 | අක්‍රීය ට්‍රැක්ටර | 2010-10-05 | ජපන් යෙන් ආධාර වැඩසටහන යටතේ ලබාදුන් රෝද දෙකේ හා රෝද හතරේ ගර්හිත ට්‍රැක්ටර් අපහරණය කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| 2005 | 07 | ට්‍රැක්ටර් සඳහා හිග වාරික අයකර ගැනීම | 2010-10-05 | වාරික මුදල් අයකර ගැනීමට සක්‍රීය වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම. |

**2.11** මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 95 | 58 | 37 |
| (ii) තෘතියික මට්ටම | 737 | 541 | 196 |
| (iii) ද්විතියික මට්ටම | 10872 | 9762 | 1073* |
| (iv) ප්‍රාථමික මට්ටම | 322 | 231 | 82* |
| **එකතුව** | **12026** | **10592** | **1388** |

* පුරප්පාඩු ගණනය කිරීමේදී ලඝු / යතුරුලේඛක අනුමත 47 ක් ක්ෂේත්‍ර සහකාර අනුමත 06 ක් හා නුපුහුණු කම්කරු අනුමත 17 ක් අනුමත සේවක සංඛ්‍යාවට එකතු කර ඇති නමුත් එම සේවාවන් යටපත්වී යන සේවාවන් බැවින් පුරප්පාඩු ගණනය කිරීමේදී අදාල කරගෙන නොමැත.

## 03. විසර්ජන ශීර්ෂය 284 වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### 3.1 විගණන විෂය පථය

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශ, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 සැප්තැම්බර් 16 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150, හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 3.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළබඳ විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශ, මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 3.4 සිට 3.11 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබූ බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසි |
| --- | --- |
| අලිවෙඩි නිකුත්කිරීමේ ලේඛනය | 2003 ඔකතෝබර් 16 දිනැති වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය අංක 15/2003 |
| ගිනිඅවි නිකුත් කිරීමේ ලේඛනය<br>පතොරම් නිකුත් කිරීමේ ලේඛනය | 2009 නොවැම්බර් 08 දිනැති වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 5/2009 |

**(ආ) පොදු තැන්පත් ගිණුම**

(i) වර්ෂ 02 ක් ඉක්ම වූ එකතුව රු.11,406,008 ක් වූ තැන්පතු 46 ක් සම්බන්ධයෙන් මුදල් 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) වෙනත් අමාත්‍යාංශයක් විසින් ලබාදී තිබුණු රු.1,259,831 ක මුදලක් අදාල කාර්යය ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඇ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය.**

විෂය අංක 28401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.3,784,313 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

### 3.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

#### 3.4.1 සංයුක්ත සැලැස්ම

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේ පිළියෙල කළයුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 3.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තා

2002 සැප්තැම්බර් 12 දිනැති හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 හා 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළයුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 ජූලි 10 දින වන විටත් පාර්ලමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 3.4.3 අභ්‍යන්තර විගණනය

(අ) 2012 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර තිබුණද වර්ෂයට අදාල අභ්‍යන්තර විගණන වැඩසටහනට අනුව අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන ඒකකයක ස්ථාපිත කර තිබුණත් සහායක කාර්ය මණ්ඩලයක් හෝ දෙපාර්තමේන්තුවේ විෂයය පථයට අනුකූල වන පරිදි ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අදාල ඒකකය වෙත අනුයුක්ත කර නොතිබුණි.

### 3.5 වත්කම් කළමනාකරණය

(අ) **නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

දෙපාර්තමේන්තුව සතු වාහන 25 ක් නිෂ්ක්‍රියව පැවති බව විගණනයේදි නිරීක්ෂණය විය .

(ආ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/ සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා 2013 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දෙපාර්තමේන්තුව විසින් අවිධිමත් ලෙස පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය වෙත ඩබල් කැබ් රථයක් මුදාහැර තිබුණි.

(ඈ) **වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම.**

වෙනත් ආයතන සතුව තිබුණු වාහන 26 ක් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

## 3.6 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) පනත් | | |
| (i) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ (469 වන අධිකාරය) 70 (1) වගන්තිය | - | 2013 දෙසැම්බර් 31 දින දක්වා උපදේශක කමිටු පත්කර නොතිබුණි. |
| (ii) 2009 අංක 22 දරන වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත 4.2 අ (2) | - | ජාතික රක්ෂිත භූමි සහ අභය භූමි සඳහා කළමනාකරණ සැලැස්මක් සකස් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රාන්තික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 104 | - | 2008 වසරේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අවස්ථා 16 කට අදාල මූලික පරීක්ෂණ පවත්වා එම අලාභයේ ප්‍රමාණය හා වගකිවයුත්තන් නිශ්චය කර නොතිබුණි. |
| (ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ<br>2002 නොවැම්බර් 08 දිනැති අංක IA/I/2002/2 දරන චක්‍රලේඛය. | - | පරිගණක හා උපාංග සඳහා වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

(ඇ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

| | | |
|---|---|---|
| 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන චක්‍රලේඛයේ 5 ඡේදය ප්‍රකාර උපලේඛනය 3.7 | 289,964 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සම්බන්ධ ණයගැති උපලේඛනයක් ඉදිරිපත් කර නොතිබුණි. |

## 3.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

### (අ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

දෙපාර්තමේන්තුව විසින පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භකළ දිනය | නිමකළ යුතු දිනය | 2012 දෙසැම්බර් 31 දිනට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | රු. | | | රු. | |
| වස්ගමුව ජාතික උද්‍යානය තුළ කිරිඔය මාර්ගය ඉදිකිරීම. | 9,402,250 | 2001.11.19 | 2002.03.19 | 1,283,767 | පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාවට පැමිණිලි කිරීම. |

### (ආ) මුදල් ප්‍රතිපාදන නිදහස්කර තිබුණද ක්‍රියාත්මක කර නොතිබුණු ව්‍යාපෘති

දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 07 කට අලි වැටවල් ඉදිකිරීම සඳහා රු.14,294,311 ක මුදලක් නිදහස් කර තිබූ නමුත් 2012 දෙසැම්බර් 31 දිනවන විටත් එම කාර්යයන් ඉටුකර නොතිබුණි.

## 3.8 කාර්යසාධනය

2012 ක්‍රියාකාර සැලසුම්වලට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගති පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යන්.

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ඉටු නොකර තිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) කුමන ජාතික වනෝද්‍යානයේ නව මාර්ග ජාලය ඉදිකිරීම.

(ii) විල්පත්තු ජාතික උද්‍යානයේ මාරවිල බීට්ටු කාර්යාලය ඉදිකිරීම.

(iii) කුමන ජාතික උද්‍යානයේ තුම්මුල්ල සංචාරක බංගලාව හා බංගලා භාරකරු නිල නිවස ඉදිකිරීම.

(iv) මන්නාරම අඩවි ආරක්ෂක කාරයාලීය නිල නිවස හා කම්කරු නිල නිවස ඉදිකිරීම.

(ආ) ගජ මිතුරෝ ව්‍යාපෘතිය

වන අලි මිනිස් ගැටුමෙන් පීඩාවට පත් දිස්ත්‍රික්ක 15 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 58 ක් තුළ වන අලි මිනිස් ගැටුම මැඩලීම ඇතුළු අරමුණු 05 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ගජමිතුරෝ ව්‍යාපෘතිය සැලැසුම් කර ක්‍රියාත්මක කර තිබුණි. 2012 වර්ෂය තුළ රුපියල් මිලියන 200 ක ප්‍රතිපාදන සළසා තිබුණද පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටුකර නොතිබුණි.

(i) අලි වැට කිලෝමීටර් 420 ක් ඉදිකිරීම සඳහා අවස්ථා 31 කදී රු.මිලියන 143.36 ක් දිස්ත්‍රික් කාර්යාල වෙත ප්‍රතිපාදන නිදහස්කර තිබුණද එම ඉදිකිරීම් සිදුකර නොතිබුණි.

(ii) විදුලි වැට ඉදිකිරීම සම්බන්ධව ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර අලි මිනිස් ගැටුම පවතින ප්‍රදේශ ලෙස පළාත් 08 ක දිස්ත්‍රික්ක 14 ක් හඳුනාගෙන තිබුණද එම දිස්ත්‍රික්කවල පවතින ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ කෙරෙහි වැඩි අවධානයක් යොමුකර නොතිබුණි.

(iii) 2012 වර්ෂය තුළදි ප්‍රධාන කාර්යාලයේ දී මිලදී ගනුලැබූ රු.මිලියන 88.6 ක් වු විදුලි වැට උපකරණ සෘජු ලෙස සහකාර අධ්‍යක්ෂ කාර්යාල හරහා ලුණුගම්වෙහෙර තොග ගබඩාව වෙත ලබා දී තිබුණි. එම ගබඩාවෙන් අදාල ඉදිකිරීම් සඳහා නිකුත් කිරීමේදී ක්‍රමවත් අභ්‍යන්තර පාලනයක් හා තොග පාලන ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කර නොතිබුණි. එසේම අලි වැට ඉදිකිරීමට අදාල පසු විපරම් කටයුතු ඉටුකර නොතිබුණි.

(iv) අලි මිනිස් ගැටුම හේතුවෙන් සිදුවන ජීවිත, දේපල හා වගා හානි අවම කරගැනීමේ අරමුණින් ප්‍රචණ්ඩකාරී පිරිමි අලින් ගාල්කර පුණුරුත්ථාපනය කිරීමට හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට කිලෝමීටර් 16 ක විදුලි වැටක් ඉදිකිරීම සඳහා කොන්ක්‍රීට් කණු 1050 ක් මිලදි ගැනීමට රු. මිලියන 96.74 ක් වැයකර තිබුණද එම කාර්ය ඉටුකර නොතිබුණි. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණක් වු වනසත්ව මිනිස් ගැටුම් අවම කරගැනීමේ ක්‍රමෝපායන් හඳුනාගැනීම, ක්‍රියාත්මක කිරීම හා කාලීන වනජීවී කළමනාකරණ සැලසුම් සකස් කිරීම යන කාර්යන් ඉටුකර නොතිබුණි.

(v) දේශිය සතුන්, වෘක්ෂලතා හා ඔවුන් ජීවත්වන ස්වභාවික පරිසරය සංරක්ෂණය කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණක් වී තිබුණි. අලි පන්නා දැමීම සඳහා සතුන දැඩි හිංසාවට භාජනය කර අලි වෙඩි මිලදිගැනීමට රු.34,863,405 ක් වැයකර තිබුණි.

මේ අනුව දේශිය සතුන් හා ඔවුන් ජීවත්වන ස්වභාවික පරිසරය සංරක්ෂණය කිරීම සඳහා පියවරක් ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(vi) අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා කරන ලද ක්‍රියාකාරකම් හා සැලසුම් අසාර්ථකවී තිබුණි.

## 3.9 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී පර්යේෂණ හා පුහුණු අංශයේ නියැදි පරීක්ෂාවලදී ගිරිතලේ පුහුණු කේන්ද්‍රයේ පර්යේෂණය සිදු කර නොතිබුණි, බාහිර පාර්ශවයන් විසින් පර්යේෂණ කමිටුවට ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති සඳහා අවසර දී තිබුණ නමුත් වාර්තා ඉදිරිපත් කර නොතිබුණ. පර්යේෂණ කමිටුව වෙනස්වීම්වලට භාජනය නොවී වර්ෂ 12 ක් කටයුතු කිරීම, ව්‍යාපෘති වර්තා පිටපත් කිසිවක් පුස්තකාලයේ පරිශීලනය සඳහා තබා නොතිබීම, පර්යේෂණ ව්‍යාපෘති ලේඛනයක් නඩත්තු නොකිරීම, පර්යේෂණ ව්‍යාපෘති පදනම් කරගෙන වනසතුන් සංරක්ෂණය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් යෝජනා ඉදිරිපත් නොකිරීම වැනි දුර්වලතා පැවතුණි.

(ආ) අංගම්මැඩිල්ල ජාතික උද්‍යානය තුළ අලි ගාල ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේදී රු.මිලියන 4.57 ක් වැයකර තිබු අතර අලින් පැටවීම හා ගොඩබෑම සඳහා වේදිකාවක් ඉදිකිරීමට රු.193,393 ක් වැයකර තිබුණත් එම ස්ථාන වල්බිහිවී නිශ්කාර්යව පැවතුණි.

(ඇ) කාර්යාලවල අලි වෙඩි නිකුත් කිරීමේ ලේඛන, අලි මරණ ලේඛනය, පතොරම් නිකුත් කිරීමේ ලේඛනය, වරද වාර්තා ලේඛනය, වාහන ලේඛනය වැනි ලේඛන විධිමත්ව පවත්වා නොතිබුණි.

(ඈ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ (469 වන අධිකාරය) 6(1) (ඉ) වගන්තිය අනුව කිසිම තැනැත්තෙකු විසින් තහනම් අඩවියක්, ජාතික වනඋද්‍යානයක්, ස්වභාව රක්ෂිත භූමියක් වන පිවිසුමක්, ආරක්ෂක ස්ථානයක්, සමුද්‍රීය රක්ෂිත ප්‍රදේශයක් හෝ සීමාන්තරීක කලාපයක් තුළ වගා කිරීම, පතල් හෑරීම හෝ අන් කිසිදු කාර්යක් සඳහා යම් ඉඩමක් ශුද්ධ කිරීම හෝ හෑරීම නොකළ යුතුය. ඊට පටහැනිව මෙම කලාපය තුළ නීති විරෝධී මත්ද්‍රව්‍ය වගා බිම් අක්කර 222.5 ක් පවත්වා තිබුණි. මෙම කළාපය තුළ දෙපාර්තමේන්තුවේ අඩවි කාර්යාල 11 ක් ද, බීට්ටු කාර්යාල 12 ක් ද, වැටලීම් ඒකකයක්ද ස්ථාපිත කර තිබුණද දෙපාර්තමේන්තුවේ අවිධිමත් පාලනය හා නිරන්තර පරීක්ෂාවන්ගේ දුර්වලතාවය නිසා නීති විරෝධී ගංජා හේන් පවත්වාගෙන යැමට ඉඩකඩ සැළසී තිබුණි. 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා මෙම ගංජාහේන් අක්කර 222.5 අවස්ථා 336 කදී වැටලීම් සිදුකර ගංජා ගස් 1,125,582 ක් සුරාබදු දෙපාර්තමේන්තුව විසින සොයාගෙන තිබුණද, ඒ පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත්වී නොතිබුණි.

පනතේ 2(අ) වගන්තිය අනුව යම් ජාතික රක්ෂිත භූමියක් ඇතුළත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සැළකිය යුතු පහසුකම් හා සේවා පරිපාලනය හා කළමනාකරණය කළයුතු වුවද, මෙලෙස නීති විරෝධී ලෙස කැලෑ එළිකිරීම් නිසා නිසි කළමනාකරණයක් සිදු නොවීම තුළින් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණක් වන වනසතුන් හා වෘක්ෂලතා ආරක්ෂා කිරීම

සඳහා,වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත ක්‍රියාත්මක කිරීම නිසි අයුරින් සිදුවී නොමැති බව නිරීක්ෂණය විය. මේ නිසා වනසතුන්ගේ නිජබිම් අහිමිවීම තුළින් අලි මිනිස් ගැටුම් උග්‍රවෙමින් පැවතුණි.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 70 | 32 | 38 |
| (ii) | තෘතියක මට්ටම | 18 | 18 | - |
| (iii) | ද්විතියක මට්ටම | 1401 | 881 | 520 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 418 | 294 | 124 |
| | එකතුව | 1907 | 1225 | 682 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 682 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.